සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

# ලංකා ඉතිහාසය I

කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. **සියලු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති **උපදෙස් පරිදි ලකුණු** කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. රන්පත් 2. තඹපත් 3. බිත්ති 4. කාසි 5. දැව (.....)
02. 1. නාමල් ඔය 2. කවුඩුලු ඔය 3. අඹන් ගඟ 4. බදුල්ල ඔය 5. උමා ඔය (.....)
03. 1. පුලනරිය 2. කඳවුරු නුවර 3. ජනනාත මංගලම් 4. විජයරාජ පුර 5. අරිට්ඨගිරි (.....)
04. 1. ඩිනාර් 2. දොයිතුව 3. තුට්ටු 4. ලැරින් 5. පතාග (.....)
05. 1. සුලෙයිමාන් 2. කුටෝ 3. අබුසයිද් 4. මක්දිසි 5. අල්බිරුනි (.....)
06. 1. මන්දාරම්පුර පුවත 2. අලකේශ්වර යුද්ධය 3. රාජසිංහ හටන 4. සමන්තපාසාදිකා 5. රාජාවලිය (.....)
07. 1. බූන්දල 2. විල්පත්තු 3. පල්ලෙමලල 4. පාහියංගල 5. පතිරාජවෙල (.....)
08. 1. අරිට්ඨ 2. තිස්ස 3. මහානාග 4. තාලිපබ්බත 5. මහල්ලක නාග (.....)
09. 1. උත්තිය 2. මහානාග 3. යටාලතිස්ස 4. ගෝඨාභය 5. කාවන්තිස්ස (.....)
10. 1. සුභද්දා 2. සුමිත්තා 3. ලෝකනාථා 4. සුගලා 5. රත්නාවලී (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. උරුවේල - කලා ඔය
 2. කාලතිත්ථ - කළු ගඟ
 3. හීමතිත්ථ - බෙන්තර ගඟ
 4 ගිම්හතිත්ථ - නිල්වලා ගඟ
 5. ගෝකණ්ණ - මහා වාලුකා නදී (.....)

12. 1. හියුං - සාං හිමි - ටිබෙට් ජාතික සංචාරක හිමිනමකි.
 2. බුද්ධඝෝෂ හිමි - ත්‍රිපිටකය පාලියට පරිවර්තනය කිරීම.
 3. වජ්‍රබෝධි හිමි - මහායාන භික්ෂුවකි.
 4. සංඝමිත්‍ර හිමි - මහසෙන් රජුගේ ගුරුවරයා වේ.
 5. ජෝතිපාල හිමි - මහා විහාරික අදහස් දැක්වූ ඉන්දීය භික්ෂුවකි. (.....)

13. 1. පර්නා ඕ ඩී ක්වේරොෂ් - ලංකාවේ දේශපාලන හා අධ්‍යාත්මික ආධිපත්‍ය
2. බැල්දියස් - ලංකා පුරාවෘතය
3. රොබට් නොක්ස් - එදා හෙළදිව
4. ජුවාම් රිබෙයිරෝ - ලංකා ඉතිහාසය
5. ආර්.එල්. බ්‍රෝහියර් - සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්. (.....)

14. 1. උරුවේල ග්‍රාම - ගෝණ නදී
2. උපතිස්ස ග්‍රාම - කදම්භ නදී
3. විජිත ග්‍රාම - මහා වාලුකා නදී
4. කාචර ග්‍රාම - කප්පකන්දර නදී
5. දීඝ ග්‍රාම - කිරින්ද නදී (.....)

15. 1. මදුරාදුනු සිරිසගබෝ - දෙවන සේන
2. කාලිංස විජයබාහු - පළමු විජයබාහු
3. සෙනෙවිමාතා - මහානාග
4. කාලිංස චක්‍රවර්තී - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල
5. මේඝවණ්ණ අභය - ගෝඨාභය (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඉහළ කඳුකර තණ බිම් | A | විල්පත්තු |
| 2. | පහතරට වියළි කලාපීය විවෘත ජනාවාස | B | හුංගම |
| 3. | වියළි කලාපීය ගල්ලෙන් | C | බටදොඹලෙන |
| 4. | වෙරළ ආශ්‍රිත විවෘත ජනාවාස | D | නකල්ස් |
| 5. | පහතරට තෙත් කලාපීය ලෙන් | E | අලිගල |

1. ABCDE 2. DBEAC 3. BACDE 4. DBAEC 5. CAEBD (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | යාල්පාන වෛපවමාලෙයි | A | මයුරපාද හිමියන් |
| 2. | අමාවතුර | B | ධර්මසේන හිමියන් |
| 3. | බුත්සරණ | C | විද්‍යාචක්‍රවර්තී |
| 4. | සද්ධර්ම රත්නාවලිය | D | ගුරුළුගෝමී |
| 5. | පූජාවලිය | E | මයිල්වාක්නා හුලවර් |

1. EDBAC 2. EDCBA 3. EDABC 4. AEDBC 5. CBDEA (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ගල්විහාර | A | තඹ සන්නස |
| 2. | අල්ලෙයි | B | ගිරිලිපිය |
| 3. | දැදිගම | C | කතිකාවත |
| 4. | තෝනිගල | D | පුවරුලිපිය |
| 5. | වල්ලිපුරම් | E | රන් සන්නස |

1. CABDE 2. CADEB 3. ACDBE 4. CADBE 5.EBDAC (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | වෙල්ගම් විහාරය | A | වට්ටගාමිණී අභය රජු |
| 2. | සෝමාවතිය | B | ගිරි අභය රජු |
| 3. | මිරිසවැටිය | C | දුටුගැමුණු රජු |
| 4. | ගෝකණ්ණ විහාරය | D | මහසෙන් රජු |
| 5. | අභයගිරිය | E | දේවානම්පියතිස්ස රජු |

1. EBCDA 2. BECDA 3. CBEDA 4. ADCEB 5. DBCEA (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. 1. | පකුණ්ඩක | A | දෙවන මුගලන් |
| 2. | අඹහෙරණ සලමෙවන් | B | පණ්ඩුකාභය |
| 3. | මපුර්මුබ බුදදස මිහිඳු | C | බුද්ධරාජ |
| 4. | සලමෙවන් මිහිඳු | D | දෙවන මිහිඳු |
| 5. | සිත්නාරුබිම් බුදල්නා | E | සිලාකාල |

1. DBACE  2. AECBD  3. BEADC  4. BDACE  5.CBDAE (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. මහාවංශය
    1. පාලි භාෂාවෙන් රචිත වංස කතාවකි
    2. අඛණ්ඩ දේශපාලන ඉතිහාසය හැදෑරීමේදී වැදගත්ම මූලාශ්‍රයයි
    3. පුනරුක්ත දෝෂ දක්නට ඇත
    4. ක්‍රි.ව. 5 - 6 සියවසවල රචනා කර ඇත.
    5. මහාවංසය රචනා කිරීමේ මූලාශ්‍රයක් ලෙස දීපවංසය ප්‍රයෝජනයට ගෙන ඇත. (.....)

22. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය
    1. ආර්ය සංක්‍රමණ
    2. විදේශීය ආක්‍රමණ
    3. මෞර්ය අභිෂේක ක්‍රමය දායාද වීම
    4. ආධාරක සේනා ලබාගැනීම.
    5. පළමුවරට මධ්‍යගත පාලන ක්‍රමයක් බිහිවීම. (.....)

23. අභිලේඛන
    1. රචනා කොට ඇති මාධ්‍ය අනුව අභිලේඛන වර්ග කර දැක්විය හැකිය.
    2. කාසි හෙවත් නානක මූලාශ්‍රය මගින් අතීත ආර්ථිකය පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකිය.
    3. මුල් අවධියේ දී ලියන ලද සෙල්ලිපි මූල බ්‍රාහ්මීය ලිපි ලෙස හැඳින්වේ.
    4. වර්තමානයේ හමු ව ඇති පැරණි ම ශිලා ලිපිය ලෙස හඳුනාගෙන ඇත්තේ උත්තිය රජුගේ නම සඳහන් මිහින්තලා ලිපියකි.
    5. ආසන ලිපි බොහොමයක් පොළොන්නරු යුගයට අයත් වේ. (.....)

24. අනුරාධපුර යුගයේ ආර්ථිකය,
    1. කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථිකයක් පැවතීම.
    2. විදේශීය හා අභ්‍යන්තර වෙළඳමට විශේෂ තැනක් හිමිවීම.
    3. සෙල්ලිපිවල හේන් පිටිබිම් ලෙස හඳුන්වා ඇත.
    4. වගා ක්‍රම අතර මඩ ගොවිතැන පැරණිතම වගා ක්‍රමයයි.
    5. සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිසගේ ලංකා ගමන සමග ලංකාවට පැමිණි විවිධ ශිල්ප ශ්‍රේණි වලට අයත් පිරිස නිසා ආර්ථිකයේ වර්ධනයක් සිදුවිය. (.....)

25. ප්‍රාග් ඓතිහාසික මානවයා,
    1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා පොදුවේ බලංගොඩ මානවයා නමින් හැඳින්වේ.
    2. මෙම අවධියට අයත් ඇට සැකිලි 75ක් පමණ හඳුනාගෙන ඇත.
    3. නළල ඉදිරියට නෙරාවිත් ඇත.
    4. විශාල දත් පිහිටා ඇත.
    5. බලංගොඩ මානවයා උස මහත ස්වරූපයකින් යුක්තය. (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
B සහ C පමණක් නිවැරදි නම් 2 ද,
C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. දීප වංසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
(A) දැනට ලංකාවේදී දැකිය හැකි පැරණිතම වංස කතාවයි.
(B) ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිටවීම පිළිබඳ තොරතුරු බහුලව සඳහන් වේ.
(C) මහා විහාරයේ වංස කතාව ලෙස ද හැඳින්වේ.
(D) දීප වංසය රචනා කිරීම සඳහා මහා වංසයේ සඳහන් තොරතුරු උපයෝගී කරගෙන ඇත. (.....)

27. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
(A) ක්‍රි.පූ. 600 - 500 කාල වලදී ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය ආරම්භවූ බව විශ්වාස කෙරේ.
(B) පිළිස්සූ මැටි වළං භාවිතය ආරම්භ වූ අවධියයි.
(C) ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සිට ආර්යයන් සංක්‍රමණය විය.
(D) ආර්යයන් ශ්‍රී ලංකාවට ලෝහ නිශ්සාරණය කිරීමේ තාක්ෂණය හඳුන්වා දෙන ලදී. (.....)

28. ශ්‍රී ලංකාවේ චෝළ පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
(A) ශ්‍රී ලංකාවේ චෝළ පාලන ප්‍රදේශය මුම්මඩි චෝළ මණ්ඩලම් ලෙස හැඳින්විය.
(B) ඔවුන් කිසි විටෙකවත් බදු දහමට අනුග්‍රහ නොදැක්වීය.
(C) ඔවුන්ගේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූයේ පොළොන්නරුවයි.
(D) පළමුවන විජයබාහු රජතුමා විසින් පොළොන්නරුවේ චෝළ පාලනය අවසන් කරන ලදී. (.....)

29. මානාභරණ රජු සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ මොනවාද?
(A) සුගලා දේවිය විවාහ කරගනිමින් රාජ්‍ය උරුමය ලබාගන්නා ලදී.
(B) පැරකුම් රජු මානාභරණගේ සහෝදරයාය.
(C) මිත්තා කුමරියගේ වැඩිමහල් පුත්‍රයා මානාභරණය.
(D) දැදිගම හෙවත් පුංඛ ග්‍රාමය කේන්ද්‍ර කරගෙන පාලනකටයුතු මෙහෙයවන ලදී. (.....)

30. පොළොන්නරු යුගයේ විදේශ සබඳතා සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ මොනවාද?
(A) පළමු විජයබාහු රජතුමා බුරුම දේශය ආක්‍රමණය කිරීම.
(B) මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහකර දීම.
(C) විජයබාහු රජු චෝළ විරෝධී රාජ්‍යන් සමඟ සබඳතා පැවැත්වීම.
(D) පාණ්ඩ්‍ය රජු ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ඉතිහාසය යනු ''මිනිසා පිළිබඳ අධ්‍යයනයක්'' යැයි ප්‍රකාශකර ඇත්තේ,
1. ජෝන් ජේ 2. කොලින් වුඩ් 3. සෙලර් 4. යෙට්මාන් 5. හෙරඩෝටස් (.....)

32. දළදා වහන්සේ ලංකාවට වැඩම කරවන ලද්දේ,
1. මඩකලපු වරායෙනි. 2. දඹකොළපටුන වරායෙනි. 3. මාතොට වරායෙනි.
4. ලංකා පටුනෙනි. 5. ඌරා තොටිනි. (.....)

33. පර්සියානු යුද්ධය නම් මූලාශ්‍රය කෘතියේ කතුවරයා කවුරුන්ද?
1. ප්‍රොකෝපියස් 2. ස්ට්‍රාබෝ 3. හිපාකස් 4. කොස්මස් 5. අබුසයිද් (.....)

34. ගණක වරුන් පිළිබඳ තොරතුරු අනාවරණය වන සෙල්ලිපියකි.
1. පරමාකන්ද ලිපිය 2. හැබැස්ස ලිපිය 3. නාගිරිකන්ද ලිපිය
4. කතරගම ලිපිය 5. මහ ඇලගම ලිපිය. (.....)

35. සේන ගුත්තිකයන් ලංකාව ආක්‍රමණය කරන අවධියේ අනුරාධපුර පාලකයා කවුරුන්ද?
1. උත්තිය 2. අසේල 3. සූරතිස්ස 4. මුටසීව 5. පණ්ඩුකාභය (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36 | ඓතිහාසික යුගයට අයත් ක්‍රි.ව. 500-ක්‍රි.ව. 1500 දක්වා කාලය මධ්‍යකාලීන යුගය ලෙස හැඳින්වේ. | සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218 කට පසු අශෝක රජුගේ අභිෂේකය සිදු කරන ලදී. (.....) |
| 37 | කෝන්ගල ලිපියෙහි කුඹල්කරුවන් පිළිබඳ තොරතුරු සඳහන් වේ. | ශ්‍රී ලංකාවේ ඉහළ පුරාශිලා යුගය සම්බන්ධයෙන් සාධක හමු නොවේ. (.....) |
| 38 | පාහියන් හිමිගේ දේශාටන වාර්තාව ලංකාව ඉතිහාසය සම්බන්ධ වැදගත් මූලාශ්‍රයකි. | පාහියන් හිමි අභයගිරි විහාරයේ දෙවසරක් වැඩ වාසය කරමින් සිංහල අටුවා ග්‍රන්ථ පාලියට පරිවර්තනය කරන ලදී. (.....) |
| 39 | පළමුවන සේන රජු විසින් දම්පියා අටුවා ගැට පදය රචනා කරන ලදී. | කුට්ටක සෙනෙවිවරයා විසින් පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කොට මාර ශ්‍රී වල්ලභ පරාජයට පත්කරන ලදී. (.....) |
| 40 | හතරවන සේන රජුගේ අවධියේ දී සිරියවේලාර් නම් චෝළ සෙනෙවියා ලංකාවේ උතුරු ප්‍රදේශය ආක්‍රමණය කරන ලදී. | දොළොස්දහස් රට ප්‍රදේශය සිරිවල්ලභ රජු විසින් පාලනය කරන ලද පාලන ප්‍රදේශයකි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 25 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ **ලංකා ඉතිහාසය II** කාලය පැය දෙකයි

**උපදෙස්**

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. ගෝණ නදී | 2. ගාල්හ නදී | 3. මාගම | 4. කල්පිටිය |
| 5. කතරගම | 6. ඉරණමඩුවැව | 7. ගම්පොල | 8. ඌව පළාත |
| 9. දඹුල්ල | 10. කෝට්ටේ | 11. මිනිපේ අමුණ | 12. ජල්ලූරවාපී (ල. 12) |

## B කොටස

01. (i) ඉතිහාසය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශනයන් සිදුකළ පුද්ගලයින් නම් කරන්න.
    A ''ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනයකි''.
    B ''වර්තමානය තේරුම් ගැනීමේ යතුර වශයෙන් අතීතය දැනගත යුතුය''. (ල. 2).
    (ii) ඉතිහාසය විෂය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන පිළිබඳ අදහස් දක්වන්න. (ල. 7)
    (iii) ඉතිහාසය පිළිබඳ ජී.එම්. ට්‍රෙවිලියන් ගේ මතය උදාහරණ ලබාදෙමින් විස්තර කරන්න. (ල. 7)

03. ශ්‍රී ලංකාවේ බාහිර භූගෝලීය පිහිටීම මෙරට දේශපාලන ඉතිහාසය හැඩගැසීම කෙරෙහි බලපෑ අයුරු විස්තර කරන්න. (ල. 16)

04. ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී නානක මූලාශ්‍රයයේ ඇති වැදගත්කම පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
    (i) ශ්‍රී ලංකාවේ භාවිත වූ පැරණිතම කාසි වර්ගය. (ල. 2)
    (ii) ශ්‍රී ලංකාවේ කාසි භාවිතයේ ඉතිහාසය පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 7)
    (iii) ඉතිහාසය හැදෑරීමේදී කාසි හෙවත් නානක මූලාශ්‍රය මගින් ඇති ප්‍රයෝජන පිළිබඳ විමසුමක යෙදෙන්න. (ල. 7)

05. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය යන්න කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)
    (ii) ශ්‍රී ලංකාවේ පහළ පුරා ශිලා යුගය සම්බන්ධයෙන් තොරතුරු ලබාගත හැකි පාරිසරික කලාප දෙක නම් කරන්න. (ල. 2)
    (iv) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ හා පූර්ව ඓතිහාසික යුගයේ දක්නට ලැබෙන වෙනස්කම් පහත දැක්වෙන මාතෘකා යටතේ විස්තර කරන්න. (ල. 10)
    1. තාක්ෂණය 2. ජනාවාස

06. ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් දේවානම් පිය තිස්ස රාජ්‍ය සමයේ ඇති වැදගත්කම පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ විස්තර කරන්න.

1. දේශපාලන වැදගත්කම    2. ආගමික වැදගත්කම    (ල. 16)

07. අනුරාධපුර යුගයේ පාලකයින් ඉන්දියාව සමග පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

08. පොළොන්නරු යුගයේ බලයට පත් පාලකයින්ගේ ක්‍රියා කලාපයන් පොළොන්නරු රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ අයුරු විස්තර කරන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.


1. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය
2. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටවීම.
3. මහා වංසයේ දුර්වලතා
4. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩ ගැසීමෙහි ලා මධ්‍යම කඳුකරයේ බලපෑම.

(එක් කොටසකට ලකුණු 08 බැගිනි)

## දෙවන වාර පරීක්ෂණය - 2019
## ලංකා ඉතිහාසය - 12 ශ්‍රේණිය
### පිළිතුරු පත්‍රය - 1 කොටස

| | | | |
|---|---|---|---|
| **01.** - 4 | **11.** - 4 | **21.** - 5 | **31.** - 2 |
| **02.** - 1 | **12.** - 1 | **22.** - 3 | **32.** - 4 |
| **03.** - 5 | **13.** - 5 | **23.** - 2 | **33.** - 1 |
| **04.** - 1 | **14.** - 5 | **24.** - 4 | **34.** - 5 |
| **05.** - 2 | **15.** - 2 | **25.** - 5 | **35.** - 3 |
| **06.** - 4 | **16.** - 2 | **26.** - 1 | **36.** - 2 |
| **07.** - 4 | **17.** - 2 | **27.** - 4 | **37.** - 3 |
| **08.** - 3 | **18.** - 4 | **28.** - 5 | **38.** - 5 |
| **09.** - 1 | **19.** - 1 | **29.** - 3 | **39.** - 4 |
| **10.** - 4 | **20.** - 3 | **30.** - 2 | **40.** - 1 |

II කොටස



2. (i) A - ආර්.පී. කොලන්වුඩ් B - ඊ.එච්. කාර්

(ii) තමා ජීවත්වන පරිසරය අවබෝධකර ගැනීමට, අනාගතය ගොඩනගාගැනීමට ආදර්ශ ලබාගැනීමට, දේශපාලන සිද්ධි හා බලවේග තේරුම් ගැනීමට, කාලය හා අවකාශය තේරුම් ගැනීමට, ජාතික අනන්‍යතාව හඳුනාගැනීමට, ජාතික සමගිය ගොඩනැගීමට.

(iii) ඉතිහාසය තුළ සියලුම විෂයන් අන්තර්ගත බව විස්තර කරතිබීම.

03. ඉන්දියාවට ආසන්නව පිහිටීම. ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීම, ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම ලංකාවේ දේශපාලනයට බලපෑ අයුරු විස්තර කර තිබීම, ආක්‍රමණ, සංක්‍රමණ, මිත්‍ර සබඳතා, ජනාවාසවීම, අභිෂේක ක්‍රම, විරුද නාම.

04. (i) කහාපන, හස් එබූ කාසි.

(ii) මුල් කාලයේ ගණුදෙනු කිරීමට භාවිතා කළ ලෝහ කැබලි, විදේශයන්ගෙන් ගෙනෙන ලද කාසි. ක්‍රි.පූ. 1 සියවසේ අගභාගයේදී හෝ ක්‍රි.ව. 1සියවසේ මුල් භාගයේ දී ලංකාවේ ස්වාධීනව කාසි නිපදවූ බවට සාක්ෂි හමුවීම.

(iii) අතීත, වෙළඳ ආර්ථික තොරතුරු ලබාගත හැකිවීම, ලෝහ තාක්ෂණය, විදේශ සබඳතා, අතීතයේ නිර්මාණ හැකියාව, කාසිවල විහිදීම අනුව බල ප්‍රදේශ වෙළඳ මධ්‍යස්ථාන හඳුනාගත හැකිවීම.

05. (i) ලිඛිත ඉතිහාසයක් ආරම්භ වීමට පෙර යුගය වසර 125000 සිට ක්‍රි.පූ. 600 දක්වා කාලය.

(ii) ඉරණමඩු සැකැස්ම, රත්නපුරයට අවට මැණික් පතල්

(iii) තාක්ෂණය - ශිලා මෙවලම් මත රඳ පවතී. රළු ශිලා මෙවලම් - ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවලම් කහද හා තිරුවානා භාවිතය, පීඩන ශල්බනය

ජනාවාස - ගල් ගුහා හා එළිමහන් ස්ථාන, ආහාර හා ජල පහසුකම් ඇති තැන්, මෙවලම් තනාගැනීමට අවශ්‍ය ගල් බහුලව පැවතීම.

06. දේශපාලන - ඉන්දියාව සමඟ මිත්‍ර සබඳතා, මෞර්ය පාලන ක්‍රමය, මෞර්ය අභිෂේක, විරුදනාම

ආගමික - බුදු සසුන පිහිටවීම, භික්ෂු භික්ෂුණී සසුන පිහිටවීම, විහාරාරාම ඉදිකිරීම, බුදු දහම රාජ්‍ය ආගම බවට පත්වීම ආදී තොරතුරු ඇතුලත්ව විස්තර කරන්න.

07. * මිත්‍ර සබඳතා * වෙළඳ සබඳතා * ආගමික සබඳතා * විවාහ සබඳතා * ආක්‍රමණ * සංක්‍රමණ * යුධ ආධාර ලබා ගැනීම. * යුධ ආධාර ලබාදීම.. උදාහරණ සපයමින් විස්තර කරන්න.

08. * පැරකුම් රජුගේ සෙනෙවිරුන්ගේ ක්‍රියාකලාපය.

* විවාහ ප්‍රතිපත්ති නිසා කාලිංඝ පාණ්ඩ්‍ය පෙළපත් අතර ගැටුම.

* දුර්වල පාලකයන් බලයට පත්වීම නිසා මධ්‍යගත පාලනය බිඳවැටීම.

* ආර්ථික පරිහානිය.65ජ

* කාලිංග මාඝගේ ආක්‍රමණය.